# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය.

**අභියාචනා අංක:- AAT/102/2025 (NPC)**

එස්.පී.එල්.ආර්.ධර්මසේන
**අභියාචක**

**එදිරිව,**
ජාතික පොලිස් කොමිෂන් සභාව
**වගඋත්තරකරු**

දිනය : 2025.10.22

**ඉදිරියේ දී** **විනිසුරු කේ.ටී.චිත්‍රසිරි (සභාපති)**
**ජේ.ජේ.රත්නසිරි (සාමාජික)**
**එස්.නන්දසේකරන් (සාමාජික)**

පෙනී සිටීම :- අභියාචක සිටී.
අභියාචක වෙනුවෙන් විශ්‍රාමික රජයේ සේවක තිස්ස ගුණතිලක මහතා
වගඋත්තරකාර පොලිස් කොමිෂන් සභාව වෙනුවෙන් නියෝජ්‍ය අධ්‍යක්ෂ මාලා බස්නායක මහත්මිය

**-<u>නියෝගය</u>-**

දෙපාර්ශවය විසින් ඉදිරිපත් කර ඇති ලේඛන වලට සහ ඔවුන් විසින් විනිශ්චය අධිකාරය ඉදිරියේ ඉදිරිපත් කරන ලද වාචික දේශනවලටද අවධානය යොමු කරමු. මෙම අභියාචනය ඉදිරිපත් කර ඇත්තේ, අභියාචක විසින් පොලිස් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනය ප්‍රතික්ෂේප කරමින් එම කොමිෂන් සභාව විසින් 2025.06.20 දින ගෙන ඇති තීරණයට එරෙහිවය.

අභියාචක විසින් මෙම විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කර ඇති අභියාචනා පෙත්සම මඟින් ඉල්ලා ඇත්තේ, ඉහත කී පොලිස් කොමිෂන් සභාවේ තීරණය ඉවත් කරමින් ඔහු වෙත පනවා ඇති සේවය අතහැර යාමේ නියෝගය ඉවත් කර දෙන ලෙසයි. 2025.06.20 දිනැතිව ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් ගෙන ඇති තීරණය වන්නේ, අභියාචනා කාර්යය පටිපාටික රීතීන්හි XV වන පරිච්ඡේදයේ, 216 වගන්තිය ප්‍රකාරව අභියාචක

විසින් ඉදිරිපත්කර ඇති අභියාචනය, නියමිත බලධාරියා වන පොලිස්පති වෙත ඉදිරිපත් කර නොමැති නිසා අභියාචනය ප්‍රතික්ෂේප කරන බවයි.

එය එසේ තිබියදීත්, ශ්‍රී ලංකා පොලිසියේ විනය හා කල්ක්‍රියා කොට්ඨාශයේ අධ්‍යක්ෂ විසින් අභියාචක වෙත දන්වා ඇත්තේ ඔහු විසින් 2024.07.10 දිනැතිව ඉදිරිපත් කරන ලද අභියාචනය සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කිරීමට හැකියාවක් නොමැති බවයි.

තවද, විශේෂ කාර්ය බලකායේ අධ්‍යක්ෂ විසින් අභියාචක වෙත එවන ලද 2024.08.22 දිනැති ලිපිය මඟින් අභියාචක වෙත දන්වා ඇත්තේ, අභියාචක විසින් නැවත සේවය ඉල්ලා ඉදිරිපත් කරන ලද අභියාචනය එම බලකායේ අණදෙන නිළධාරි විසින් සලකා බැලීමෙන් පසුව, නැවත සේවය ඉල්ලා ඉදිරිපත් කර ඇති එකී අභියාචනයේ මුල් පිටපත ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති බවයි.

ඒ අනුව පැහැදිළිව පෙනී යන්නේ, ඔහුගේ සේවය අතහැරයාම ඉවත් කර ගැනීම සඳහා අභියාචක විසින් ඉදිරිපත් කර ඇති අභියාචනය, එවකට ඔහු පාලනයට යටත් වන විශේෂ කාර්ය බලකායේ අණ දෙන නිළධාරියා වෙත ඉදිරිපත් කර ඇති බවයි. තවද එහි සඳහන් දිනයන් පරීක්‍ෂා කර බැලීමේදී ඉදිරිපත් කර ඇති අභියාචනය එවකට පනවා ඇති රෙගුලාසි යටතේ වන, නියමිත කාලපරිච්ඡේදය තුළ අභියාචක විසින් ඉදිරිපත් කර ඇති බවද පැහැදිළි වේ.

ඉහත සඳහන් තත්ත්වය පරීක්‍ෂා කර බැලීමේදී පෙනී යන්නේ, මෙම කරුණු සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති අභියාචනය, අභියාචක විසින් ඔහු නියුතුව සිටි විශේෂ කාර්ය බලකායේ ප්‍රධානියා මඟින් ඉදිරිපත් කර තිබූ බවයි. එම කරුණු සලකා බැලීමේදී පෙනී යන්නේ ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් 2025.06.20 දිනැති ලිපියේ සඳහන් හේතූන් නිවැරදි නොවන බවයි.

2024.04.03 දිනැති ලිපිය මඟින් අභියාචක වෙත දන්වා ඇත්තේ ඔහු 2024.03.17 දින සිට තනතුරු අතහැර ගියා සේ සළකා ක්‍රියාකරන බවයි. එකී තනතුරු අතහැර යාමේ නියෝගය ලැබීමෙන් අනතුරුව, එම නියෝගය ඉවත්

කර ගැනීම සඳහා අභියාචක විසින් 2024.07.10 දිනැති අභියාචනය ඉදිරිපත් කර ඇත.

එම ලිපියේ පිටපතක් ජාතික පොලිස් කොමිෂන් සභාව වෙතද ඉදිරිපත් කර ඇති අතර එය දැනටමත් නඩු වාර්තාවටද ගොනු කර ඇත. එම ලිපියේ සඳහන් වන්නේ, ඔහුගේ බිරිඳ අසනීප තත්ත්වයට පත් වීමෙන් පසු දරුවන්ගේ කටයුතු සොයා බලා ඉටු කර ගැනීම සම්බන්ධයෙන් ඇතිවූ ගැටළුකාරී තත්ත්වය මත සේවයට වාර්තා කිරීමට නොහැකි වූ බවයි. ඔහුට පාසල් යන ගැහැණු දරුවන් දෙදෙනෙකු සිටින බවද එහි වැඩිදුරටත් සඳහන් වේ. අභියාචකගේ බිරිඳගේ අසනීප තත්ත්වය තහවුරු කිරීම සඳහා 2025.08.29 වන දිනැතිව ගම්පොළ ශික්ෂණ රෝහලේ වෛද්‍ය නිළධාරී විසින් නිකුත් කරන ලද වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කර ඇත. එම වෛද්‍ය සහතිකයේ සඳහන් වන්නේ, අභියාචකගේ බිරිඳ යැයි කියනු ලබන නිලූකා සංජීවනී යන අය මානසික දූර්වලතාවයකින් පෙළෙන බව සහ ඒ සඳහා දිගටම වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමේ අවශ්‍යතාවයද පැන නැගී ඇති බවයි. ඒ අනුව පෙනී යන්නේ අභියාචක විසින් සේවයට වාර්තා නොකිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති කරුණු සත්‍ය කරුණු හැටියට පිළිගත හැකි බවයි.

තවද, අභියාචක සේවය හැර ගොස් ඇති 2024.03.17 දින සිට දින 115 ක් ඇතුළත, නැවත සේවය ඉල්ලමින් ඉහත කී අභියාචනය ඉදිරිපත් කර ඇත. ඒ මඟින් පැහැදිළි වන්නේ අභියාචක සේවය සම්පූර්ණයෙන් අතහැර යාමේ චේතනාවකින් කටයුතු කර නොමැති බවයි. අනෙක් අතට ඔහු සේවයේ තවදුරටත් රැඳී සිටීමේ අභිලාෂයකින් කටයුතු කර ඇති බවද ඒ මඟින් වැඩි දුරටත් තහවුරු වේ.

ඉහත සඳහන් කරුණු වලින් පැහැදිළි වන්නේ අභියාචක සේවය අතහැර යාමට හේතු වූ ක්‍රියාකාරකම් සහ අභියාචක සේවයේ නිරතව සිටීමේදී ඇති වූ අභිලාෂ යන අංග දෙකෙන්ම යුක්තව අභියාචක කටයුතු කර ඇති බවයි. මෙම තත්ත්වය පහත සඳහන් නඩු තීන්දු 2හිම පැහැදිළිව ප්‍රකාශයට පත් කර ඇත.

ශ්‍රේෂ්ඨාධිකරණයේ පැවති "**ටයිටස් ජයන්ත** එදිරිව **ලංකා ගමනාගමන මණ්ඩලය** "(SC Appeal 133/2016) නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණය මෙසේ සඳහන් කර ඇත.

> **"An employee who fails to report to work without an acceptable excuse for a reasonable period of time would necessarily be a ground which justifies the employer to consider the employee as having vacated service."**

තවද "**ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව** එදිරිව **ජාතික සේවක සංගමය** " 1993(02) SLR-316 දරන නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ප්‍රකාශ කර ඇත්තේ, සේවය හැර ගිය තැනැත්තාගේ ක්‍රියාකාරකම් සහ නිවාඩු ලබා නොගෙන දීර්ඝ කාලයක් සේවයට නොපැමිණීම යන කරුණු සළකා බැලීමේදී එම නිළධාරියා කුමන චේතනාවකින් කටයුතු කර තිබේ දැයි තීරණය කළ හැකි බවයි.

තවද අභියාචක වෙනුවෙන් කරුණු ඉදිරිපත් කරමින් දන්වා සිටින්නේ ඔහු අවුරුදු 23ක් විශේෂ කාර්ය බලකායට අනුයුක්තව රාජකාරියෙහි නියුක්තව සිටි බවයි. ඔහුට එරෙහිව කිසිඳු විනයානුකූල පියවරක් ගෙන නොමැති බවටද කරුණු ඉදිරිපත් කර ඇත.

ඉහත කී සියළු කරුණු සළකා බලා 2024.04.03 දිනැතිව විශේෂ කාර්ය බලකායේ යාපන සේනාංකයේ අණ දෙන නිළධාරි විසින් නිකුත් කර ඇති තනතුරු අතහැර යාමේ නියෝගය ඉවත් කිරීමට තීරණය කරමු. මෙම නියෝගය හේතුවෙන්, අභියාචක සේවයේ නිරතව නොසිටි කාලපරිච්ඡේදය සඳහා ඔහුට කිසිඳු වැටුපක් හෝ දීමනාවක් හිමි නොවිය යුතුය. තවද අභියාචක නැවත සේවයට පත් කිරීමට පෙර අභියාචක සම්බන්ධයෙන් පසුබිම් වාර්තාවක් ලබා ගැනීමෙන් අනතුරුව, එකී වාර්තාවේ අභියාචක සම්බන්ධයෙන් කිසිඳු අයහපත් කරුණක් වාර්තා ගත නොවේ නම් පමණක් මෙම නියෝගය ක්‍රියාත්මක කළ යුතු බවට තවදුරටත් තීන්දු කරමු. ඉහත තීරණය ක්‍රියාත්මක කරන ලෙස ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත නියෝග කරමු.

ඉහත සඳහන් කොන්දේසියට යටත්ව, අභියාචක ඉදිරිපත් කර ඇති අභියාචනයට අවසර දීමට තීරණය කරමු.

අභියාචනයට අවසර දෙමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි.

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි.

එස්.නන්දසේකරන්
(සාමාජික)

දෙව්මිනි/-